# 17දා පෞද්ගලික අංශයට නිවාඩු නොදෙන සේවායෝජකයන්ට එරෙහිව නීත්‍යානුකූල පියවර

■ අමිත් මධුරංග

මහ මැතිවරණය පැවැත්වෙන ලබන 17 වැනිදා පෞද්ගලික අංශයේ සේවකයන්ට නිවාඩු ලබා නොදෙන සේවායෝජකයන්ට එරෙහිව නීත්‍යනුකූලව පියවර ගැනීමේ හැකියාව ඇතැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවසීය.



එවැනි සේවායෝජකයන්ට කම්කරු දෙපාර්තමේන්තුව හරහා නීතිමය ක්‍රියාමාර්ගවලට පිවිසීමටත්, අධිකරණයෙන් සිරදඬුවම් සහ දඩ පැනවීමටත් අවස්ථාව තිබෙන බව හෙට්ටිආරච්චි මහතා පවසා සිටියේය.

කොළඹ ඊයේ (12දා) පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේ, ආයතනයේ සිට ඡන්ද මධ්‍යස්ථානයට කිලෝමීටර් 40ක් දක්වා දුරින් සිටින සේවකයන්ට දින භාගයක්ද, කිලෝමීටර් 40 - 100 අතර, දුරින් සිටින අයට දින 1 ½ ක්ද, කිලෝමීටර් 100 ට වඩා දුරින් සිටින අයට දින දෙකක නිවාඩුවක්ද ලබාදිය යුතු බවයි.

මෙම මාධ්‍ය හමුවේදී රෝහණ හෙට්ටිආරච්චි මහතා විසින් පැෆරල් සංවිධානය වෙත මේ දක්වා වාර්තාවන පැමිණිලි හා ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳවද කරුණු අනාවරණය කළේය.

එක්සත් ජාතික පක්ෂයට එරෙහිව පැමිණිලි 392 ක්ද, එක්සත් ජනතා නිදහස් සන්ධානයට එරෙහිව පැමිණිලි 376ක්ද, ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව පැමිණිලි 34 ක් හා වෙනත් පක්ෂවලට එරෙහිව පැමිණිලි 29 ක් ලැබී තිබෙන බව ඔහු පවසා සිටියේය.

පීඩාවට පත්වීම් සම්බන්ධව එජාපයෙන් පැමිණිලි 62 ක්ද, එජනිසයෙන් 45 ක්ද, ජ.වි.පෙන් 08 ක් හා වෙනත් පක්ෂවලින් පැමිණිලි 10 ක් ලැබී ඇතැයිද හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

මේ දක්වා සිද්ධි 984 කට අදාළ මැතිවරණ හා වෙනත් නීති උල්ලංඝනය කිරීමේ සිද්ධීන් 1049 ක් වාර්තා වී තිබෙන බවත්, ඉන් බරපතළ සිද්ධි 138 කට අදාළ නීති උල්ලංඝනය කිරීමේ 157 ක්ද, රෝහල් ගතවීම් 03 කද වාර්තා වන බවද ඒ මහතා පෙන්වා දුන්නේය.

www.ada.lk
අද
බ්‍රහස්පතින්දා
2015-08-13